**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදලේ (ජීඑෆ්ඒටීඑම්) සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ සංරචකය ව්‍යාපෘතිය - 2013**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදලේ (ජීඑෆ්ඒටීඑම්) සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ සංරචකය ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 නොවැම්බර් 22 දින එළඹි අංක එස්ආර්එල් - 911 - ජී 15 - එස් දරන ප්‍රදාන ගිවිසුමේ ඇ (8) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘති විෂය පථය හා කාර්යයන්, අයවැය ලේඛන, වැදගත් අවස්ථා හා දර්ශක ඇතුළු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වගකීම දරයි. උතුරු පළාතේ පසු ගැටුම් ප්‍රදේශවල සෞඛ්‍ය ආරක්ෂණ සේවා කඩිනමින් ප්‍රතිස්ථාපනය කිරීම මඟින් එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව පිළිබඳ වර්තමාන අඩු පැතිරීම පවත්වාගෙන යාම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 15,513,020 ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජුලි 15 දින ආරම්භ කරන ලද අතර 2016 ජුනි 30 වන විට නිම කිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන විස්තරාත්මක මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘති ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානයෙන් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

**-----------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.226,127,425 (එජඩො 1,751,401) ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.474,254,086 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| **වර්ගය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|---|---|
| | **2013** | | **2012** | | |
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** | **රු.** |
| දේපල, පිරියත හා උපකරණ | 13,128 | 1,716,492 | 12,813 | 1,675,316 | 3,391,808 |
| සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කාර්යයන් | 1,738,273 | 224,410,933 | 1,853,510 | 236,507,882 | 470,862,278 |
| | 1,751,401 | 226,127,425 | 1,866,323 | 238,183,198 | 474,254,086 |

## 4.2 මුදල් ප්‍රවාහය

වයාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, මුදල් ප්‍රවාහය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | | |
|---|---|---|---|---|
| | **2013** | | **2012** | |
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** |
| විදේශාධාර - ප්‍රදාන වලින් ලද මුදල් (වැය සම්මතය- 13) | 1,398,916 | 180,600,000 | 1,990,596 | 254,000,000 |
| දේශීය අරමුදල්වලින් ලද මුදල් - (වැය සම්මතය -17) | 147,173 | 19,000,000 | 27,429 | 3,500,000 |
| | 1,546,089 | 199,600,000 | 2,018,025 | 257,500,000 |
| ලංසු ආදායමෙන් ලද මුදල් | 4,516 | 583,000 | - | - |
| වැඩ සටහන් වියදම් සඳහා ගෙවූ මුදල් | (1,738,273) | (224,410,933) | (1,853,510) | (236,507,882) |
| අත්තිකාරම් ( ශුද්ධ ) | 305,443 | 39,936,639 | (184,047) | (23,403,356) |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම (ආපසු ගෙවිය යුතු තැන්පතු - ලංසු) | - | 6,224 | - | - |
| විදේශ විනිමය පාඩුව | 2,368 | - | 569 | - |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම (රඳවා ගැනීම් මුදල්) | (69,243) | (9,059,737) | 93,154 | 11,845,476 |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් | 50,900 | 6,655,193 | 74,191 | 9,434,238 |
| | 50,900 | 6,655,193 | 74,191 | 9,434,238 |
| ස්ථාවර වත්කම් | (13,128) | (1,716,492) | (13,176) | (1,675,316) |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය | | | | |
| අමාත්‍යාංශයට මුදල් ආපසු ගෙවීම | (37,772) | (4,938,701) | (61,017) | (7,758,923) |
| මුදල්වල ශුද්ධ වැඩිවීම | - | - | - | - |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

අධීක්ෂණ හා ඇගයීම් කාර්යයන් වෙනුවෙන් වියදම් සඳහා ලෙජර ගිණුම, සාවද්‍ය ගිණුම්කරණ සටහන් හේතුවෙන් රු.291,539 ක් වූ ඍණ අගයක් දක්වා තිබුණි.

### 5.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 135 හා 2013 ජනවාරි 21 දිනැති අංක එස්එෆ්ජ්/01/2013 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ 28 හා 42 ඡේද | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් අනුමත කළ යුතු සීමාව රු.2,000,000 ක් විය. එහෙත් නිශ්චිත සීමාවන් ඉක්මවා අවස්ථා 29 කදී එකතුව රු.178,230,654 ක ගෙවීම් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබුණි. කෙසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014 ඔක්තෝබර් මාසයේදී ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | රු.3,391,808 ක් වටිනාකමවූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණය සමාලෝචිත වර්ෂය සඳහා සිදුකර නොතිබුණි. |

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය සඳහා හා 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් ශ්‍රී ලං ර | 15.51 | 1,766.58 | 793.88 | 1.398 | 180.60<br>19.00 | 1.39 | 179.99<br>19.00 | 3.402 | 435.05 |
| | 15.51 | 1,766.58 | 793.88 | 1.398 | 199.6 | 1.39 | 198.99 | 3.402 | 435.05 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 318 කට සමාන එජඩො මිලියන 2.417 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ලැබී තිබුණද, රු.මිලියන 180.6 ක් පමණක් ව්‍යාපෘතියට මුදාහැර තිබු අතර එයින් රු.මිලියන 180 ක මුදලක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ අයවැය ලේඛනයට අනුව, ගෝලීය අරමුදල විසින් 2011 ජුලි සිට 2013 දෙසැම්බර් දක්වා එජඩො මිලියන 5.67 ක මුදලක් වියදම් දැරීමට අපේක්ෂා කර එජඩො මිලියන 5.36 ක් ව්‍යාපෘතියට මුදාහැර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 45 ක් ඉකුත්වීමෙන් පසුව මුළු ප්‍රදානයෙන් සියයට 22 ක් නියෝජනය වු එජඩො මිලියන 3.40 ක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉතිරි කාල පරිච්ඡේදය වන මාස 30 ඇතුළත එජඩො මිලියන 12.11 ක් වු ප්‍රදානයේ ඉතිරිවී ඇති මුදල උපයෝජනය කිරීමට හැකිවේද යන්න සැක සහිතය.

(ආ) රු.103,362,884 ක් වටිනා කාර්යයන් 12 ක් සඳහා සලසන ලද අයවැය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ සම්පුර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අදාළ පාර්ශ්වයන්ගෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව වෙනත් කාර්යයන් 03 ක් සඳහා සලසන ලද අයවැය ප්‍රතිපාදන රු.30,378,945 කින් ඉක්මවා තිබුණි.

(ඈ) ව්‍යාපෘති කාර්යයන් 19 ක් සඳහා අයවැය ලේඛනයෙන් රු.666,626,410 ක මුදලක් වෙන්කර තිබුණද, රු.140,601,704 ක් හෙවත් මුළු වෙන්කිරීමෙන් සියයට 21 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

**6.2 භෞතික කාර්ය සාධනය**

----------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාදී තිබු අත්තිකාරම්වලට අදාළ මුල්‍ය පාලනයන් පිළිබඳව නිවැරදි පරිචයන්ව්‍යාපෘතිය විසින් අනුගමනය කර නොතිබුණි. පරිචයක් වශයෙන් විවිධ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාදීමට පෙර දැරිය යුතු වියදම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. එබැවින් ඇස්තමේන්තු නොමැතිව අවස්ථා 12 කදී එකතුව රු.5,640,777 ක් වු අත්තිකාරම් ලබාදී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතුව රු.125,000 ක් වු අත්තිකාරම් අරමුණු කළ කාර්යයන් සඳහා එම අත්තිකාරම් යොදා ගැනීමෙන් තොරව මාසයකට පසුව ආපසු ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ මුල්‍ය පාලනයන් ශක්තිමත් කිරීමට හැකිවන පරිදි, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳව සිදුකරන ලද ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(ඇ) ප්‍රදානයෙන් ලැබුණු මුදල්වලින් රු.4,938,701 ක මුදලක් එම මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයේදී මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා තිබු බව නිරික්ෂණය විය.

**7. පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය
(ආ) තොග
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ගිණුම්කරණය
(ඊ) අග්‍රිම හා අත්තිකාරම් නිරවුල් කිරීම